සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



0328

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉස්ලාම් I
இஸ்லாம் I
Islam I

44 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

※ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ **ඔබේ විභාග අංකය** ලියන්න.
※ උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න**.

---

1. ෂිර්ක් අස්හර් යටතට එන කාණ්ඩය
   (1) යාතිකාව, හූනියම් කිරීම, යක්ෂයින් ඇදහීම, හඳහන් බැලීම
   (2) පූර්ව නිමිති දැකීම, අල්ලා දෙවියන්ගේ නාමයෙන් බාර වීම, වශී ගුරුකම් කිරීම, අල්ලාහ් හැර වෙනත් අයකුගේ නාමයෙන් කැප කිරීම
   (3) යාතිකාව, හූනියම් කිරීම, කේන්ද්‍ර බැලීම, චන්ද්‍රයා නැමදීම
   (4) ජින්වරුන් ඇදහීම, අල්ලාහ් හැර වෙනත් අයකුගේ නාමයෙන් දිවුරුම් දීම, නූල් බැඳීම, හඳහන් බැලීම
   (5) මැලැක්වරුන් ඇදහීම, දෙමව්පියන් නැමදීම, නූල් බැඳීම, ගුරුතුමා පැමිණෙන විට නැගිටීම

2. රිද්දත්වල ප්‍රතිඵල දැක්වෙන කාණ්ඩය
   (1) විවාහය කඩාකප්පල් වීම, පිය උරුමය අහිමි කිරීම, මුස්ලිම් සුසාන භූමියක භූමදානය කිරීමේ අයිතිය නැති කිරීම, මුස්ලිම් පාලනය යටතේ කත්ල් දඬුවමට බැඳී සිටීම
   (2) විවාහය කඩාකප්පල් වීම, මුස්ලිම් පාලනය යටතේ කත්ල් දඬුවමට බැඳී සිටීම, පවුල් සම්බන්ධතාවෙන් වෙන් වීම, පිය උරුමය අහිමි කිරීම
   (3) විවාහය කඩාකප්පල් වීම, රටින් පිටුවහල් කිරීම, පිය උරුමය අහිමි කිරීම, මරණයෙන් පසු ජනාසා සලාතය ඉටු කිරීමෙන් වැළකීම
   (4) විවාහය කඩාකප්පල් වීම, පිය උරුමය අහිමි වීම, මුස්ලිම් සුසාන භූමියක භූමදානය කිරීමේ අයිතිය නැති කිරීම, තඃසීර් දඬුවමට යටත් වීම
   (5) විවාහය කඩාකප්පල් වීම, තමන්ගේ දරුවන් පිළිබඳ අයිතිය අහිමි කිරීම, මස්ජිදවලට යාමේ අයිතිය අහිමි කිරීම, ජනාසාව බැලීමේ අයිතිය අහිමි කිරීම

3. නබිවරුන්ගේ මූලික ලක්ෂණ ඇතුළත් කාණ්ඩය
   (1) ෆතානද්, ඉස්මත්, තබ්ලිහ්, කිත්බ්
   (2) ඉස්මත්, කියානත්, ෆතානද්, සිද්ක්
   (3) තබ්ලිහ්, ෆතානද්, ඉස්මත්, සිද්ක්
   (4) සිද්ක්, කරාමත්, ඉස්මත්, ෆතානද්
   (5) ඉස්මත්, ෆතානද්, තබ්ලිහ්, මුඃජිසා

4. නබිවරයකු තුළින් දැකිය **නොහැකි** ගුණාංග ඇතුළත් කාණ්ඩය,
   (1) කියානද්, කිත්බ්, කිත්මාන්, ඉස්මත්
   (2) තබ්ලිහ්, බලාදත්, කියානද්, කිත්බ්
   (3) කිත්මාන්, කිත්බ්, කියානද්, සිද්ක්
   (4) බලාදත්, කියානද්, කිත්බ්, ෆතානද්
   (5) බලාදත්, කියානද්, කිත්බ්, කිත්මාන්

5. ෆික්හ් විද්වතුන් ඇතුළත් කාණ්ඩය,
   (1) ඉමාම් අහමඩ්, ඉමාම් සුහ්රි, ඉමාම් මාලික්, ඉමාම් රාෆි
   (2) ඉමාම් සාෆි, ඉමාම් නසාර්, ඉමාම් නවවි, ඉමාම් අහමඩ්
   (3) ඉමාම් අබු හනීෆා, ඉමාම් මාලික්, ඉමාම් අබු යූසුෆ්, ඉමාම් හසන් අල් බස්රි
   (4) ඉමාම් සාෆි, ඉමාම් නවවි, ඉමාම් මාලික්, ඉමාම් අහමඩ් බින් හන්බල්
   (5) ඉමාම් මාලික්, ඉමාම් රමලී, ඉමාම් අබු දවූද්, ඉමාම් රාෆි

6. මදීනා රාජ්‍යයේ 'සහිබුස් සූක්' ලෙස හඳුන්වනු ලැබූ නිලධාරියා
   (1) විනිශ්චයකරු ය.
   (2) වෙළඳසැල් පරීක්ෂා කරන්නා ය.
   (3) ලේකම් ය.
   (4) තානාපති ය.
   (5) සේනාධිපති ය.

[ දෙවෙනි පිටුව බලන්න.

7. තෆ්සීර් හි නිපුණයකු වූ නබිතුමාගේ සහායකයා වූයේ
(1) ඉබ්නු අබ්බාස් ය.
(2) ඉබ්නු උමර් ය.
(3) ඉබ්නු මසූද් ය.
(4) අබු හුරෙයිරා ය.
(5) සාද් ඉබ්නු අබී වක්කාස් ය.

8. බැග්ඩෑඩයෙහි කාලිද් ඉබ්නු බකායා ශ්‍රී ලංකාවට යැවීමට හේතුව
(1) ශ්‍රී ලංකාවේ රජු හමුවීම ය.
(2) ශ්‍රී ලංකාවේ වෙළඳපොළ පිළිබඳ දැනුම ලබා ගැනීම ය.
(3) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ට ආගමික ඉගැන්වීම් සඳහා ය.
(4) ශ්‍රී පාදය නැරඹීම ය.
(5) කුළු බඩු හා මැණික් මිලදී ගැනීම ය.

9. සංචාරක ඉබන් බතූතා උපන්නේ
(1) යේමනයේ ය.
(2) ඊජිප්තුවේ ය.
(3) බැග්ඩෑඩ් හි ය.
(4) අරාබි අර්ධද්වීපයේ ය.
(5) මොරොක්කෝවේ ය.

10. කුරුණෑගල අස්සැද්දුමෙන් මුස්ලිම් කාන්තාවක් විවාහ කර ගත්තේ යැ'යි විශ්වාස කෙරෙන රජුගේ නම
(1) කීර්ති ශ්‍රී රාජසිංහ ය.
(2) විජයබාහු ය.
(3) ශ්‍රී වික්‍රම රාජසිංහ ය.
(4) II වන බුවනෙකබාහු ය.
(5) ධාතුසේන ය.

11. අරාබි දෙමළ ක්ෂේත්‍රයට දායක වී ඇති විද්වතෙකි,
(1) කසාවත්තේ ආලිම්.
(2) අයි. එල්. එම්. අබ්දුල් අසීස්.
(3) උමර් හසරත්.
(4) අබ්දුල් හමීඩ් බක්රි.
(5) වාපිච්චි මරික්කාර්.

12. 'කිත්බා' යනු
(1) විවාහය සඳහා සුදුස්සකු තෝරා ගැනීම ය.
(2) විවාහය පිළිබඳ සාකච්ඡා කර ගැනීම ය.
(3) යෝග්‍යතාව බැලීම ය.
(4) මනාලියගේ කැමැත්ත බැලීම ය.
(5) විවාහ මංගල්‍යයේ දී කරනු ලබන දේශනය ය.

13. 'කුල්උ' යන්නෙහි අර්ථය
(1) කැඩීම ය.
(2) ශාප කිරීම ය.
(3) ඉවත් කිරීම ය.
(4) භාර්යාව මවට සැසඳීම ය.
(5) දිවුරුම් දී එය කඩ කිරීම ය.

14. "ලේ ඥාති සබඳතාව කඩ කරන්නකුට දිව්‍ය ලෝකයට යා නොහැකි ය." යන්න
(1) කුර්ආනයෙහි වගන්තියකි.
(2) සහාබිවරුන්ගේ ප්‍රකාශයකි.
(3) තාබීවරුන්ගේ ප්‍රකාශයකි.
(4) ඉමාම්වරුන්ගේ ප්‍රකාශයකි.
(5) නබිතුමාගේ කියමනකි.

15. නබිතුමාට ප්‍රසිද්ධියේ ශාප කළ අයෙකු වන්නේ
(1) අබූ ජහ්ල් ය.
(2) උත්බා ය.
(3) ෂයිබා ය.
(4) අබූ ලහබ් ය.
(5) වහ්ෂි ය.

16. පිරිමින් සඳහා රත්‍රන් පැළඳීම තහනම් කිරීමට හේතුව
(1) එය පිරිමිකම අඩු කිරීමක් වීම ය.
(2) එය පිරිමින් සඳහා හරාම් වීම ය.
(3) ඉස්ලාම් සුඛෝපභෝගීත්වයට අකමැති වීම ය.
(4) එය ආර්ථිකයට බලපෑමක් වීම ය.
(5) එය කාන්තාවන් සඳහා පමණක් අවසර දීමක් වීම ය.

17. සෙයිද් කුත්බ් වැදගත් ස්ථානයක් ගන්නා ක්ෂේත්‍රයක් වන්නේ
(1) තෆ්සීර් ය.
(2) හදීස් ය.
(3) ෆික්හ් ය.
(4) තර්බියා ය.
(5) අකීදා ය.

18. තෆ්හීමුල් කුර්ආන් හි විශේෂ ලක්ෂණය වන්නේ, එය
(1) අල්-කුර්ආනයෙහි භාෂාමය අලංකාරය ඉදිරිපත් කිරීම ය.
(2) අල්-කුර්ආනයෙහි නීති පැහැදිලි කිරීම ය.
(3) අල්-කුර්ආනයෙහි විද්‍යාත්මක සත්‍ය පැහැදිලි කිරීම ය.
(4) අල්-කුර්ආනයෙහි සඳහන් විශ්වාස පැහැදිලි කිරීම ය.
(5) ඉස්ලාමීය සමාජයේ වාදාත්මක පසුබිම පැහැදිලි කිරීම ය.

[ තුන්වෙනි පිටුව බලන්න.

19. බහුතරය මුස්ලිම් ජනයා වෙසෙන සමාජයක මුස්ලිම්වරුන් සමඟ ඉවසීමෙන් ජීවත් වන සුළුතරය වූ මුස්ලිම් නොවන ජනතාව හඳුන්වනු ලබන්නේ
(1) අහ්ලුල් කිතාබ් ලෙස ය.
(2) හර්බිස් ලෙස ය.
(3) කුෆ්ෆර් ලෙස ය.
(4) දිම්මී ලෙස ය.
(5) මුෂ්රික් ලෙස ය.

20. මදීනාවේ දී නබිතුමාගේ පෞද්ගලික ලේකම් ලෙස කටයුතු කළ තැනැත්තා වන්නේ
(1) අලි (රලි) ය.
(2) බිලාල් (රලි) ය.
(3) සෙයිද් බින් සාබිත් ය.
(4) අබ්දුල්ලාහ් ඉබ්නු උම්මි මක්තුම් ය.
(5) හුසෙයිෆා ඉබ්නු යමාන් ය.

- අංක **21** සිට **30** තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති යෙදුමට සම්බන්ධ ඒවා පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

21. ආහාද් හදීස්වල ඉස්නාද් පදනම් කරගනිමින් සැදුණු කණ්ඩායම:
A - මුර්සල්
B - මුඃමුල්
C - මෂ්හූර්
D - මුන්කති
E - මුඅල්ලක්
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

22. ඉජ්මා වර්ග:
A - ඉජ්මා සරීහ්
B - ඉජ්මාඋල් උලමා
C - ඉජ්මා සුකූති
D - ඉජ්මා මුරක්කබ්
E - ඉජ්මාඋල් අක්ෂරියියා
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

23. කියාස් හි ප්‍රතිලාභ:
A - එය ඉස්ලාමීය නීතිය සංවර්ධනයට උපකාරී වෙයි.
B - එය පැන නඟින නව ප්‍රශ්න විසඳීමට උපකාරී වෙයි.
C - එය සෑම විටක ම පැන නඟින සියලු ප්‍රශ්න විසඳීමට උපකාරී වෙයි.
D - එය දැනුම භාවිත කරමින් තර්කානුකූල ව ප්‍රශ්න විසඳීමට උපකාරී වෙයි.
E - එය ඉස්ලාමයෙහි උද්යෝගී ක්‍රියාකාරිත්වයට හේතු වෙයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

24. ඉමාම් බුහාරි:
A - ඔහු හිජ්රි 160 දී බුකාරා හි ඉපදුණේ ය.
B - ඔහුගේ නම මුහම්මද් ඉස්මායිල් ය.
C - ඔහුගේ හදීස් ග්‍රන්ථය අල්-කුර්ආනය හැරුණු විට ඇති වැදගත් ම ග්‍රන්ථය ලෙස සැලකේ.
D - ෆාතුල් බාරි, සහීහුල් බුහාරි පිළිබඳ කරන ලද විවරණවලින් එකකි.
E - ඔහුගේ අනෙකුත් ග්‍රන්ථ අතුරෙන් 'අත්-තාරික් උල් කබීර්' වැදගත් වේ.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

25. නබිතුමාගේ හදීස් අනුව වංකබවෙහි ලක්ෂණ:
A - බොරු කීම
B - සලාම්වලට පිළිතුරු දීමෙන් වැළකීම
C - පොරොන්දු කඩ කිරීම
D - විශ්වාසය කඩ කිරීම
E - විවාදයේ දී වක්‍ර අදහස් ප්‍රකාශ කිරීම
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

26. ලෝකය අවසානයේ පහළවන මහා පෙරනිමිතිවලින් සමහරක්:
A - ඉමාම් මහ්දිගේ පැමිණීම
B - ඊසා (අලෛ) නබිතුමාගේ පැමිණීම
C - යඃජූජ් හා මඃජූජ්ගේ පැමිණීම
D - බටහිරින් හිරු උදා වීම
E - භූමිකම්පා වැඩි වීම
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

27. තීන්දුවේ දිනයට සම්බන්ධ අවස්ථාවල පදනම මත වූ බොහෝ නම් ඇත. ඒවායින් සමහරක්:
A - යව්මුද්දීන්
B - යව්මුල් කියාමා
C - යව්මුල් ෆුර්කාන්
D - යව්මුල් බඃස්
E - යව්මුල් හිසාබ්
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

28. කලා කද්ර්වලට සම්බන්ධ අහ්ලුස් සුන්නා දරන ස්ථානය:
A - මිනිසාට තමාට කැමති පරිදි කටයුතු කිරීමේ නිදහස නොමැති වීම
B - අල්ලාහ්ගේ කැමැත්තට හැර මිනිසාගේ උත්සාහයට අනුව කිසිවක් සිදු නොවීම
C - මිනිසා ඔහුගේ පාලනයට හෝ ස්වාභාවික සිද්ධීන්වලට එරෙහිව වගකියනු නොලැබීම
D - මිනිසකුට යහපත් ක්‍රියාවල නිරත වීමට ද අයහපත් ක්‍රියාවලින් වැළකීමට ද ඔහුට බුද්ධිය දීම
E - මිනිසාට දෙනු ලබන ක්‍රියාවේ නිදහස නිසා ඔහුගේ සියලු ක්‍රියා සඳහා ඔහු වගකිව යුතු වීම
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

[ හතරවෙනි පිටුව බලන්න.

29. ඉස්ලාමීය අකීදවලට විරුද්ධ වන සංකල්ප:
A - මුහම්මද් නබිතුමා සමඟ නබිත්වය අවසන් නොවේ.
B - මිනිසා යනු දෙවියන් වහන්සේගේ නියෝජිතයා ය.
C - මවන්නා හා මැවීම එක සමාන ය.
D - අල්-කුර්ආනය ඉස්ලාමයේ එකම මූලාශ්‍රය වේ.
E - විකාසනයේ ප්‍රතිඵලයක් ලෙස මිනිසා පොළොව මත පෙනී සිටී.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

30. පහසු උච්චාරණය සඳහා අල්-කුර්ආනය බෙදූ ඇති පිළිවෙළ:
A - ජුස්උ  B - මන්සිල්  C - රුකූඋ
D - ඓන්  E - බාබ්
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට අදාළව X හා Y යටතේ තොරතුරු කිහිපයක් සපයා ඇත. X හි තොරතුරු Y හි තොරතුරු හා කිසියම් ආකාරයකින් සම්බන්ධ වන නමුත් ඒවා නිවැරදිව ගළපා නොමැත. X හි තොරතුරු Y හි තොරතුරු හා නිවැරදිව පිළිවෙළින් ගළපා ඇති පිළිතුර තෝරන්න.

31.

| X | Y |
|---|---|
| (i) කුර්ආන් | A වහි ගයීර් මත්ලු |
| (ii) කියාස් | B මව්කූෆ් |
| (iii) හදීස් | C වහි මත්ලු |
| (iv) ඉස්තිහ්සාන් | D ඉල්ලත් |
| (v) කව්ලුස් සහාබි | E අබූ හනීෆා |

(1) DEBAC (2) CDABE (3) CBDEA (4) DEABC (5) EACDB

32.

| X | Y |
|---|---|
| (i) ජාමිඋල් බයාන් | A ජලාලයින් |
| (ii) ඉමාම් සුයූති | B ඉමාම් තබරි |
| (iii) ඉමාම් ෆක්රුදීන් අර්-රාසි | C තන්තාවි |
| (iv) අල් ජවාහිර් | D කෂ්ෂාෆ් |
| (v) ඉමාම් සමක්ෂාරි | E මෆාතිහුල් කයිබ් |

(1) BAECD (2) EBACD (3) DBEAC (4) EACDB (5) EBCAD

33.

| X | Y |
|---|---|
| (i) අරෆා | A අස් සාබුල් මදනි |
| (ii) අර්ෂ් | B ජබලුර් රහ්මා |
| (iii) නාර් | C අල් කන්දක් |
| (iv) උහුද් | D ජහාන්නම් |
| (v) අල් ෆාතිහා | E කුර්සි |

(1) DABCE (2) EDBCA (3) BEACD (4) BEDCA (5) EDABC

34.

| X | Y |
|---|---|
| (i) රිබා | A පූර්ව දීමනා |
| (ii) ඉජාරා | B රැස්කිරීම |
| (iii) මීරාස් | C හරාම් |
| (iv) ඉහ්තිකාර් | D බදු දීම |
| (v) සලම් | E අසබා |

(1) ADEBC (2) CDAEB (3) DEABC (4) CAEBD (5) CDEBA

35.

| X | Y |
|---|---|
| (i) ඉමාම් අබූ දවූද් | A නිෂාපූර් |
| (ii) කුරාසාන් | B ඉමාම් නසාඊ |
| (iii) ඉමාම් මුස්ලිම් | C ඉමාම් තිර්මිදි |
| (iv) ඉරාන් | D සිජිස්තාන් |
| (v) හිජ්රි වර්ෂ 303 දී මරණය සිදු වීම | E ඉබ්නු මාජා |

(1) ACBED (2) ECBAD (3) DCAEB (4) EDBCA (5) BADEC

The National e-learning Portal for the General Education

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නවල යෙදුම් දෙක බැගින් දී ඇත. මෙම යෙදුම්වලට අදාළ ප්‍රතිචාර පහත (1), (2), (3), (4), (5) යනුවෙන් දක්වා ඇත. ඒ අනුව එක් එක් ප්‍රශ්නයෙහි යෙදුම්වලට වඩාත් ගැළපෙන සම්බන්ධතාව දක්වෙන නිවැරදි පිළිතුරෙහි අංකය තෝරන්න.

| අංකය | පළමු යෙදුම | දෙවැනි යෙදුම |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | පළමු යෙදුම තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමු යෙදුම | දෙවැනි යෙදුම |
|---|---|---|
| 36. | උරුමයෙන් 1/8 ක කොටසක් භාර්යාවට අයත් ය. | උරුමයෙන් 1/6 ක කොටසක් ස්වාමිපුරුෂයාට අයත් ය. |
| 37. | 'මුස්ලිම් ආරක්ෂකයා' ශ්‍රී ලංකාවේ පළ වූ පුවත්පතකි. | 'අල් සච්චාෆ්' ශ්‍රී ලංකාවේ පළ වූ තවත් පුවත්පතකි. |
| 38. | ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ පුද්ගලයකුගේ ප්‍රතිලාභය සැලකිල්ලට ගනු ලබයි. | ඉස්ලාමීය ආර්ථික ක්‍රම දිව්‍යමය වේ. |
| 39. | ඊමාන් හි මූලික ප්‍රතිපත්ති තුනකි. | තව්හිද්, රිසාලා හා මාද් ඊමාන්හි මූලික ප්‍රතිපත්ති වේ. |
| 40. | මුඃතසිලා හි පුරෝගාමියා වූයේ හසන් අල් බස්රි ය. | කුර්ආනය නිර්මාණය වූ ග්‍රන්ථයක් බව මුඃතසිලාවරුන්ගේ මතයයි. |

41. ඉස්ලාමයෙහි උසුල් සම්බන්ධ විවිධ අදහස් ඇති වීම
(1) තියත වේ.
(2) අසත්‍ය වේ.
(3) විය නොහැකි වේ.
(4) පිළිගැනේ.
(5) අනිවාර්ය වේ.

42. ඉස්ලාමීය දෘෂ්ටිකෝණයෙන් වර්තමාන ලෝකයේ ඇති ප්‍රධාන ගැටලුව වන්නේ
(1) සදාචාර පිරිහීම ය.
(2) දේශපාලන අර්බුද ය.
(3) ආර්ථික ගැටලු ය.
(4) පරිසර අර්බුද ය.
(5) සෞඛ්‍ය ගැටලු ය.

43. කාබීර්ගේ අදහස හඳුන්වන්නේ
(1) මර්ෆු ලෙස ය.
(2) කබර් ලෙස ය.
(3) මක්තු ලෙස ය.
(4) මව්කුෆ් ලෙස ය.
(5) මුස්නද් ලෙස ය.

44. නබිතුමා විසින් මත්ද්‍රව්‍ය ගැනීම විස්තර කර ඇත්තේ
(1) මහා පවක් ලෙස ය.
(2) මුදල් නාස්තියක් ලෙස ය.
(3) කෙනෙකුගේ සිහිය නැති කරන්නක් ලෙස ය.
(4) ශාරීරික සෞඛ්‍යයට හානි කරන්නක් ලෙස ය.
(5) සියලු නරක ක්‍රියාවල උපත ලෙස ය.

45. රාමසාන් මාසයේ දී ඔබ උපවාසයේ යෙදෙන්නේ කුමක් නිසා ද'යි මුස්ලිම් නොවන මිතුරකු ඔබෙන් විමසුවහොත් ඔබ දෙන පිළිතුර වන්නේ
(1) උපවාසය මගින් කෙනකුට මනා ශාරීරික සෞඛ්‍යයක් ලබා දෙන බවයි.
(2) කෙනකුට බඩගින්නේ දුක දනෙන බවයි.
(3) එය අල්ලාහ්ගේ නියමයක් වන අතර අණට කීකරු වීමක් බවයි.
(4) මුස්ලිම්වරයකු උපවාසයේ යෙදීම සුදුසු වන බවයි.
(5) උපවාසය මගින් කෙනකුට මුදල්, ද්‍රව්‍ය හා ආධ්‍යාත්මික ප්‍රතිලාභ ලැබෙන බවයි.

46. 'මුහම්මද් නබිතුමාට පසු නබිවරුන් පෙනී සිටිනු ඇත' යන මතය
(1) කුෆ්ර්වලට මග පෙන්වයි.
(2) මහාපවකි.
(3) ශිර්ක් ය.
(4) අසත්‍යයකි.
(5) වැරදි පිළිගැනීමකි.

[ හයවෙනි පිටුව බලන්න.

47. වර්තමානයේ ජීවත් වන ශ්‍රේෂ්ඨ විද්වතකු වන්නේ
(1) අබුල් හසන් අලි නද්වි ය.
(2) මුහම්මද් අල් ගසාලි ය.
(3) ෂෙයික් ඉබ්නු බාස් ය.
(4) යූසුෆ් අල් කර්දවි ය.
(5) ෂෙයික් සෙයිඩ් අත්තන්තාවි ය.

48. ඉස්ලාමීය ලෝකයේ පැරණිතම ජාත්‍යන්තර ඉස්ලාමීය විශ්වවිද්‍යාලය වන්නේ
(1) මැලේසියාවේ ජාත්‍යන්තර ඉස්ලාමීය විශ්වවිද්‍යාලයයි.
(2) මදීනා ඉස්ලාමීය විශ්වවිද්‍යාලයයි.
(3) පකිස්තානු ජාත්‍යන්තර ඉස්ලාමීය විශ්වවිද්‍යාලයයි.
(4) අලිගාර් විශ්වවිද්‍යාලයයි.
(5) අල් අසාර් විශ්වවිද්‍යාලයයි.

49. සකාත් ලැබීමට සුදුසුකම් ලත් අය අතුරෙන් වර්තමානයේ නිවාස නොමැති අය ඇතුළත් කරනු ලබන කණ්ඩායම වන්නේ
(1) ෆීසාබීලිල්ලාහ් ය.
(2) ඉබ්නුස් සබීල් ය.
(3) වහලුන් ය.
(4) කාරිමූන් ය.
(5) අලි මුඅල්ලෆත් කුලූබ් ය.

50. භාරගත් ඕනෑම කාර්යයක් නිසි ලෙස කළ යුතු බව තහවුරු කෙරෙන ඉස්ලාමීය සංකල්පය වන්නේ
(1) කිලාෆත් ය.
(2) ඉමාරත් ය.
(3) ඉහ්සාන් ය.
(4) ඉබාදත් ය.
(5) අස්-සම්උ වත්තාආ ය.

***

0328

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉස්ලාම් II
இஸ்லாம் II
Islam II

**44 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස්:

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් හිමි වේ.

## I කොටස

1. පහත සඳහන් ඉස්ලාමීය සංකල්ප විස්තරාත්මක ව පැහැදිලි කරන්න.
   (i) අකීදා
   (ii) ඉබාදා
   (iii) අක්ලාක්
   (iv) මුආමලාත්

2. පහත සඳහන් ඒවා සම්බන්ධ ෂරිආ නීති පැහැදිලි කරන්න.
   (i) ආහාර
   (ii) ඇඳුම්

3. අජ්නබි, මහ්රම් සම්බන්ධව පහත සඳහන් මාතෘකා යටතේ ලියන්න.
   (i) ස්ථිර මහ්රම්
   (ii) තාවකාලික මහ්රම්
   (iii) අජ්නබි-මහ්රම් සම්බන්ධ සීමා පවත්වාගෙන යාමේ වැදගත්කම

## II කොටස

4. පහත සඳහන් මාතෘකා පදනම් කරගෙන ඉස්ලාමීය සමාජ ක්‍රමයෙහි විශේෂ ලක්ෂණ සාකච්ඡා කරන්න.
   (i) සමානත්වය
   (ii) සහෝදරත්වය
   (iii) සමාජ සාධාරණත්වය
   (iv) සාමූහික වගකීම

5. (i) දෙමව්පියන් උදෙසා දරුවන්ගේ යුතුකම් පැහැදිලි කරන්න.
   (ii) දෙමව්පියන් විසින් දරුවන්ට ඉටු කළ යුතු යුතුකම් පැහැදිලි කරන්න.

6. (i) මස්ජිද් හි ඓතිහාසික දායකත්වය පැහැදිලි කරන්න.
   (ii) මස්ජිදයේ තත්කාලීන තත්ත්වය හා සමාජ පුනර්ජීවනයෙහි දී මස්ජිද්වල කාර්යභාරය කුමක් විය යුතු ද'යි සාකච්ඡා කරන්න.

7. පහත සඳහන් මාතෘකා යටතේ කියාස් පිළිබඳ සාකච්ඡා කරන්න.
   (i) නීති මූලාශ්‍රයක් ලෙස කියාස් ගොඩනැගීමට හේතු
   (ii) අර්කානුල් කියාස් හා කියාස් වර්ග

8. (i) ඉස්ලාමය විසින් අනුමත කරනු ලැබූ මානව අයිතිවාසිකම් පැහැදිලි කරන්න.
   (ii) නූතන ලෝකයේ මානව හිමිකම්වලට සම්බන්ධ ගැටලු සඳහා ඉස්ලාමය විසින් දෙනු ලැබූ විසඳුම් සාකච්ඡා කරන්න.

* * *